# වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය
# பெருந்தோட்டக் கைத்தொழில் மற்றும் ஏற்றுமதி கமத்தொழில் அமைச்சு
# Ministry of Plantation Industries and Export Agriculture

11 මහල, සෙත්සිරිපාය II අදියර, බත්තරමුල්ල.
11ஆம் மாடி,செத்சிரிபாய இரண்டாம் தொகுதி,பத்தரமுல்ல.
11th Floor, Sethsiripaya Stage II Battaramulla.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යතුමා / அமைச்சர் / Minister | 011-2187111 | ලේකම් / செயலாளர் / Secretary | 011-2186017 | ඊ-මේල් / ஈ-மெயில் / E-mail | secvpi@sltnet.lk | කාර්යාලය / அலுவலகம் / Office | 011-2186160 | ෆැක්ස් / தொலைநகல / Fax | 011-2186076 |
| Fax | 011-2186257 | Fax | 011-2186016 | | | | | Web – www.plantationindustries.gov.lk | |


ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය / எனதுஇல / My No — MPI/PMMD/08/RPC-G

දිනය / திகதி / Date — 08.04.2020

ලේකම්, මුදල්, හා ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
ලේකම්, සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
ලේකම්, විදේශ සබඳතා අමාත්‍යාංශය
ලේකම්, කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යාංශය
ලේකම්, මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
ලේකම්, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය
පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව
අධ්‍යක්ෂ ජනරාල්, වාණිජ දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පාලක ජනරාල්, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව
සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
සභාපති, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
සභාපති, ශ්‍රී ලංකා වරාය අධිකාරිය
අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය

**COVID 19 වසංගත තත්ත්වය රට තුළ ව්‍යාප්ත වීම පාලනය කිරීමේදී ප්‍රාදේශිය වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන මහා පරිමාණ වතුවල කටයුතු අකර්මණ්‍ය නොවී පවත්වාගෙන යාම**

ඉහත කරුණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් නිකුත් කර ඇති අංක PTF/01 හා 2020.03.28 දිනැති චක්‍රලේඛය කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කරවමි.

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකයට ඉමහත් දායකත්වයක් සපයන ප්‍රාදේශිය වැවිලි සමාගම්වලට අයත් වතු ආශ්‍රිතව සමස්ත වශයෙන් මිලියනයකට ආසන්න ජනතාවක් ජීවත්වන අතර 175,000ට ආසන්න පිරිසක් සෘජුවම මෙම ක්ෂේත්‍රයේ රැකියා කරනු ලැබේ.

කෙසේ වෙතත් වර්තමානයේ උද්ගත වී ඇති COVID 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රාදේශිය වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන මහා පරිමාණ වතුවල වගා කටයුතු, කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමේදී සහ නිෂ්පාදන ප්‍රවාහනයේදී සහ සැපයුම්ජාලය පවත්වාගෙන යාමේදී ඇතිවූ දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම පිරිස දැඩි අපහසුතාවයකට මුහුණ පා ඇති අතර, මෙම වසංගත තත්ත්වය තුරන් කිරීම සඳහා රජය විසින් ගෙන යන වැඩපිළිවෙලට සමගාමීව ප්‍රාදේශිය වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන මහා පරිමාණ වතුවල ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමටත්, ජාතික ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යාමටත් අවශ්‍ය පියවර ගත යුතු වේ.

ඒ අනුව, අත්‍යාවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.04.04 දින අරලියගහ මන්දිරයේදී පැවති සාකච්ඡාවේදී එළැඹි තීරණය පරිදි, ප්‍රාදේශිය වැවිලි සමාගම් විසින් කළමනාකරණය කරනු ලබන මහා පරිමාණ වතුවල ප්‍රජාව හට ස්වකීය ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව යෙදීමටත්, ප්‍රාදේශිය වැවිලි සමාගම් යටතේ පාලනය වන කර්මාන්තශාලා වල නිශ්පාදන සැපයුම් කර්මාන්තය සහ නිශ්පාදනයන් ප්‍රවාහනයට අදාල කටයුතු යථා පරිදි පවත්වාගෙන යාමටත් හැකිවන පරිදි, අත්‍යාවශ්‍ය පහසුකම් හා සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කරමි.

**රවීන්ද්‍ර හේවාවිතාරණ**
ලේකම්
වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය

**පිටපත්:**

1. සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
2. සභාපති, තේ පර්යේෂණ මණ්ඩලය
3. සභාපති, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
4. සභාපති, ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය
5. සභාපති, පොල් සංවර්ධන අධිකාරිය
6. අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
7. තේ කොමසාරිස්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය
8. අධ්‍යක්ෂ, වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය
9. සභාපති, ශ්‍රී ලංකා වැවිලිකරුවන්ගේ සංගමය
10. සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය
11. සභාපති, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය
12. සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය
13. සභාපති, කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය

(1–12) } කරු අවශ්‍ය කටයුතු සඳහා